**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**

කොමිෂන් සභා චක්‍රලේඛ අංක:12/2019

අංක 20, වෝඩ් පෙදෙස
කොළඹ 07.

2019 නොවැම්බර් මස 22 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**රාජ්‍ය විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන ආයතන තුළ නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීම සඳහා ක්‍රියාත්මක කළ යුතු උපාය මාර්ග/ක්‍රියාමාර්ග**

'නවක වදය' මුවාවෙන් නවක සිසුන් විශාල සංඛ්‍යාවක් ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨයින් විසින් හිරිහැරයන්ට, අයුතු බලපෑම කිරීම් හා අපයෝජනයට ලක් කර ඇති බවට සාක්ෂි විශාල සංඛ්‍යාවක් ලැබී ඇති අතර මෙම ක්‍රියාවන් දැන් සාමාන්‍ය ජනතාවගේ අවධානයට යොමු වී තිබේ. විශ්වවිද්‍යාල විසින් නවක වදය වැළැක්වීම සඳහා තාවකාලික පියවර ගෙන ඇති අතර මේවා විවිධ මට්ටම්වල සාර්ථකත්වයන් ලබා ඇත. අවාසනාවකට මෙන් එසේ ලබා ගත් පියවරයන්, තිරසාර ක්‍රමානුකූල ධනාත්මක වෙනසක් ඇති කිරීමට සමත් නොවීය. මෙම අධ්‍යයනයන්, නවක වද ගැටළුව පිළිබඳව වටිනා අවබෝධයක් ලබා දුන්නද, ඒවා වැළැක්වීම සඳහා වූ ක්‍රමානුකූල ව්‍යාප්ත උපාය මාර්ග හා ක්‍රියාමාර්ග සමඟ බැඳී නොතිබුණි. එබැවින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත්වන ලද ප්‍රතිපත්ති හා උපාය මාර්ගයන් සමඟ බැඳුනු පද්ධතිමය පර්යේෂණයක් තුළින් නවක වදයට හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට එරෙහිව සටන් කිරීම සඳහා වූ උපාය මාර්ග සමූහයක් සකස් කරන ලදී.

සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාලවල විවිධ පාර්ශවකරුවන් සමඟ උපදේශක වැඩමුළු මාලාවක් පැවැත්වූ අතර පසුව 2019 නොවැම්බර් 14 දින පැවති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක රැස්වීමේදී, ඉහත සඳහන් කළ වැඩමුළු මාලාවෙන් ලබා ගත් ප්‍රතිඵල අවසානයකට ගෙන එන ලදී.

මෙම චක්‍රලේඛයේ උපාය මාර්ග/ක්‍රියාමාර්ග අඩංගු වේ.

මෙම කොමිෂන් සභා චක්‍රලේඛයේ දක්වා ඇති උපාය මාර්ග සහ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමටත්, මෙහි අඩංගු උපාය මාර්ග හා ක්‍රියාමාර්ගයන් මත පදනම්ව අදාළ අතුරු ව්‍යවස්ථා සංවර්ධනය කිරීමත් කටයුතු කරන ලෙස විශ්වවිද්‍යාලවලට උපදෙස් ලබා දී ඇත.

1. විශ්වවිද්‍යාල විසින් නවක වදයේ හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයේ මානුෂික නොවන බලපෑම පිළිබඳව සංවේදී කිරීම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

2. විශ්වවිද්‍යාල ප්‍රවේශය අපේක්ෂාවෙන් සිටින සිසුන් සහ ඔවුන්ගේ දෙමාපියන්, ප්‍රදේශයේ ආගමික නායකයින්, මාධ්‍ය සහ පොදු ජනතාව සඳහා එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

3. එවැනි දැනුවත් කිරීම්වලින් ලබාගත් ජාලකරණය සහ සන්නිවේදනයන්, තම දරුවන් කිසි විටෙකත් නවක වදයට හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට සම්බන්ධ නොවිය යුතු බවත්, නවක වදය ලබා දෙන්නන්ට බිය නොවීමට ආත්ම විශ්වාසය වර්ධනය කර ගත යුතු බවත් දෙමාපියන්ට ඒත්තු ගැන්වීම සඳහා භාවිතා කළ යුතුය.

4. උප කුලපතිවරුන් සහ පීඨාධිපතිවරුන් විසින් ආගමික නායකයින් සහ ප්‍රාදේශීය පාසල් වල විදුහල්පතිවරුන් ඇතුළු ප්‍රජා නායකයින්ගේ ජාලයක් නිර්මාණය කළ යුතු අතර එමගින් ඔවුන්ගේ බලපෑම භාවිතා කර විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේ හැකියාව ඇති සිසුන්ගේ දෙමාපියන්ට තම දරුවන් කිසි විටෙකත් නවක වදයට සම්බන්ධ නොවන බවත්, නවක වදය ලබා දෙන්නන්ට බිය නොවිය යුතු බවත් ඒත්තු ගැන්විය යුතුය.

5. විශ්වවිද්‍යාලයට ඇතුළු වන සෑම නවක ශිෂ්‍යයෙකුටම, ඔවුන් නවක වදයට සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට මුහුණ දෙන විට ඔහු/ඇය විසින් උපකාර ලබා ගැනීමට සහ මඟ පෙන්වීම සඳහා යා යුත්තේ කා වෙත දැයි යන්න විස්තර කරන මුද්‍රිත පත්‍රිකාවක් විශ්වවිද්‍යාල විසින් ලබා දිය යුතුය. ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය/සාධාරණත්වය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සහ නවක වදය වැළැක්වීම සඳහා වූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මධ්‍යස්ථානය විසින් විශ්වවිද්‍යාලවලට එම අත් පත්‍රිකාව සඳහා පොදු ආකෘතියක් නිර්මාණය කිරීමට උපකාරී වනු ඇත.

6. විශ්වවිද්‍යාල විසින්, 1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනත සහ 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත පිළිබඳව සිසුන්ව සහ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් සකස් කිරීමට නියමිතය.

7. විශ්වවිද්‍යාල විසින් විශ්වවිද්‍යාල පරිපාලනය, අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ දෙමාපියන් අතර සමීප සබඳතාවක් ඇති කර ගැනීමට පද්ධතියක් සකස් කළ යුතු අතර නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් දෙමාපියන්ට පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා තිරසාර ආයතනික යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.

8. පළමු වන අධ්‍යයන වාරයේ විභාග සඳහා පෙනී සිටින ලියාපදිංචි නවක සිසුන් සංඛ්‍යාව විශ්වවිද්‍යාල විසින් අධීක්ෂණය **කළ යුතුය**. සිසුන් පළමු වන අධ්‍යයන වාර විභාගයට නොපැමිණීමට හේතු සාධක විශ්වවිද්‍යාල විසින් නිශ්චය කළ යුතු අතර, ඔවුන්ට සුදුසු පරිදි උපදේශනය ලබා දී අධ්‍යයන කටයුතු කරගෙන යාමට දිරිමත් කළ යුතුය.

9. **සියලුම විශ්වවිද්‍යාල විසින් සියළුම පළමු අධ්‍යයන වාර විභාග අවසානයේදී, අධ්‍යයන කටයුතු අතහැර දැමූ අයගේ ලැයිස්තුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.**

10. නවක වද එවැනි ක්‍රියාවන් සිදු කරන ස්ථාන, සිද්ධීන් සහ අපරාධකරුවන් පිළිබඳ බුද්ධි තොරතුරු ලබා ගැනීම සඳහා පිරිසිදු කිරීමේ සේවා, ආපනශාලා සහ ආරක්ෂක අංශ වැනි බාහිර සේවා සපයන්නන් සමඟ විශ්වවිද්‍යාල සමීප සබඳතාවයකින් කටයුතු කළ යුතුය.

11. විශ්වවිද්‍යාල තුළ නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය යන ක්‍රියාවන් මැඩපැවැත්වීම සඳහා සහභාගී වන සියළුම දෙනා සඳහා අඛණ්ඩ සහාය සහ පහසුකම් ලබා දීම උපකුලපතිවරුන් සහ පාලක සභා විසින් සහතික කළ යුතුය.

12. නවක වදය සහ ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධ ක්‍රියාකාරකම් විධිමත් කිරීම සඳහා ශිෂ්‍ය නේවාසිකාගාර පාලකවරුන්, විනය පාලකයින්, විනයාරක්ෂක නිලධාරීන් සහ ශිෂ්‍ය උපදේශකයින්ගේ සහභාගිත්වයෙන් නිතිපතා රැස්වීම් පවත්වන අතර උප කුලපතිවරුන් සහ පීඨාධිපතිවරුන් විසින් එහි මුලසුන හොබවනු ඇත.

13. එවැනි අත්දැකීම් වාර්තා කිරීමට  සිසුන්ගේ විශ්වාසය ගොඩනැගීමට සහාය වීම සඳහා ශිෂ්‍ය-ගුරු අන්තර්ක්‍රියා වැඩි දියුණු කිරීමට විශ්වවිද්‍යාල කටයුතු කළ යුතුය.

14. නවක වදය හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටළු විසඳීමට කටයුතු කිරීමේදී උපකුලපතිවරුන් / පීඨාධිපතිවරුන්, විශ්වවිද්‍යාල ගුරු සංගම් වල සහයෝගය ලබා ගත යුතුය.

15. පීඨයන් විසින් සිසුන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව දැනුවත් කිරීමට සහ ඔවුන්ගේ දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමට ඇති මාර්ග සහ නවක වදයට සම්බන්ධ වීමේ අවදානම සහ ලැබෙන දඬුවම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා නිතිපතා වැඩමුළු පැවැත්වීම සිදු කළ යුතුය.

16. විශ්වවිද්‍යාල විසින් විශ්වවිද්‍යාල මට්ටමින් සහ පීඨ මට්ටමින් නවක වදයට එරෙහි කමිටු පිහිටුවිය යුතුය.

17. විශ්වවිද්‍යාල නවක වද විරෝධී කමිටුව උපකුලපතිවරයාගේ ප්‍රධානත්වයෙන් රැස් විය යුතුය.

18. පීඨයේ නවක වද විරෝධී කමිටුව මෙහෙයවනු ලබන්නේ අදාළ පීඨාධිපති විසිනි.

19. නවක වදයට එරෙහි කමිටුවේ සංයුතියට අධ්‍යයන කාර්ය මණ්ඩලය, පරිපාලන කාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය, විනය පාලකයින්/ විනයාරක්ෂක නිලධාරීන්/ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය කවුන්සිල සාමාජිකයින්, දෙමාපියන්, නව සහ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයින් ඇතුළත් විය යුතුය.

20. නවක වද විරෝධී කමිටුව විසින් විශ්වවිද්‍යාලයේ / පීඨයේ නවක වද කටයුතු නිරීක්ෂණය කිරීම, සුදුසු තීරණ ගැනීම සහ සභාව දැනුවත් කිරීම සඳහා නිතිපතා රැස්වීම් පැවැත්විය යුතුය.

21. නවක වදය හා ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය ප්‍රතික්ෂේප කරන සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට ත්‍යාග පිරිනැමීමට උපකුලපතිවරුන්/පාලක සභාව සුදුසු යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.

22. උපකුලපතිවරුන්/ පීඨාධිපතිවරුන් විසින් සුදුසු තාක්ෂණයක් යොදා ගත යුතුය (උදා: නිරීක්ෂණ නිලධාරීන් සඳහා ජංගම දුරකථන, සාක්කුවල දමා ගත හැකි කැමරා ආදිය)

23. දෙමාපියන්ගේ සහයෝගය ඇතිව නවක වදය වැළැක්වීම සඳහා හදිසි පැමිණීම් ඇතුළත් නිරීක්ෂණ යාන්ත්‍රණය.

24. විශ්වවිද්‍යාල විසින් *සිසුන්ගේ ආචාර ධර්ම පද්ධතිය* විශ්වවිද්‍යාල වෙබ් අඩවිය හරහා ප්‍රසිද්ධ කළ යුතුය.

25. විශ්වවිද්‍යාල විසින් ශිෂ්‍ය සංගම්වල නිලධාරීන්ගේ නිසි සංයුතිය; සෑම ශිෂ්‍ය කණ්ඩායමකින්ම සමාන නියෝජනයක් සහ සුදුසු ස්ත්‍රී පුරුෂ නියෝජනයකින් පවතිව බවට සහතික කළ යුතුය.

26. විශ්වවිද්‍යාල පද්ධතිය පිළිබඳව සිසුන්ගේ විශ්වාසය නැති වීම වැළැක්වීම සඳහා සිසුන්ගේ පැමිණිලි ඉදිරිපත් කිරීමේදී ඵලදායි විමර්ශණ ක්‍රියාවලින් (මූලික හා විධිමත් විමර්ශණ) විශ්වවිද්‍යාලය විසින් සහතික කළ යුතුය.

27. ඵලදායි විමර්ශණ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම සඳහා විශ්වවිද්‍යාලයට පැමිණීම අත්හිටුවා ඇති අය දැඩි ලෙස විශ්වවිද්‍යාල සීමා මායිම්වලින් බැහැරවී සිටින බවට විශ්වවිද්‍යාල සහතික විය යුතුය.

28. උපකුලපතිවරුන්/පාලක සභා විසින් අනුකම්පාව පදනම් කරගෙන දඬුවම් අධීක්ෂණය කිරීම හෝ අඩු කිරීම සිදු නොකළ යුතුය.

29. නවක වදය පිළිබඳ පැමිණිලි, *1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනතේ* **2 වන වගන්තිය** යටතේ ගොනු කරන ලෙසත්, සාපරාධී බිය ගැන්වීමේ අවස්ථා පිළිබඳ පැමිණිලි, *1998 අංක 20 දරන අධ්‍යාපන ආයතනවල නවක වදය සහ වෙනත් ස්වරූපයේ සාහසික ක්‍රියා තහනම් කිරීමේ පනතේ* **3 වන වගන්තිය** යටතේ ගොනු කරන ලෙසත් විශ්වවිද්‍යාල විසින් පොලිසියට බල කළ යුතුය.

30. ඊට සමගාමීව, නවක වදය පිළිබඳ යම් පැමිණිල්ලක් වාර්තා වූ සෑම අවස්ථාවකම විශ්වවිද්‍යාල සිය පරීක්ෂණ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාමට නියමිතය.

31. නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සඳහා පිළියම් යෙදීමට උප කුලපතිවරුන් විසින් සුදුසුකම් ලත් කැපවූ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් විශ්වවිද්‍යාල මට්ටමින් පත් කළ යුතුය.

32. නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සඳහා පිළියම් යෙදීමට පීඨාධිපතිවරුන් විසින් පීඨ මට්ටමින් කේන්ද්‍රස්ථානයක් පත් කළ යුතුය.

33. සෑම සභා රැස්වීමකම නවක වදය සහ ලිංගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය යන විෂය න්‍යාය පත්‍රයට ඇතුළත් අංගයක් විය යුතුය.

34. දුක්ඛිත පාර්ශවයන් විසින් මූලික අයිතිවාසිකම් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමේදී උපකුලපතිවරුන් සහ පාලක සභාවේ සාමාජිකයින් විසින් තම වගකීම, වගවීම සහ අනාරක්ෂිත භාවය පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

35. 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ කාර්ය මණ්ඩලය, සිසුන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා උප කුලපතිවරුන් / පීඨාධිපතිවරුන් / පාලක සභා විසින් ප්‍රමාණවත් පියවර ගත යුතුය.

අ/කළේ : මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත් : 1. ලේකම්/නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

2. සභාපති කාර්යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

3. උප සභාපති / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්

5. ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

6. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරිවරුන්

7. පීඨාධිපතිවරුන්

8. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරිවරුන්

10. උසස් අධ්‍යාපන ආයතන/ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්

11. මණ්ඩප/ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරිවරුන්/ සහකාර ලේඛකාධිකාරිවරුන්

12. මණ්ඩප/ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරිවරුන්/ සහකාර මූල්‍යාධිකාරිවරුන්

13. අභ්‍යන්තර විගණක / විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

14. විශ්වවිද්‍යාලවල රජයේ විගණන අධිකාරිවරුන්

15. උසස් අධ්‍යාපන ආයතනවල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්

16. වෘත්තීය සමිති ලේකම්වරුන්

17. විගණකාධිපති

ලිපි ගොනු අංක :යූජීසී/සිජීජීර්/පීඔ_ඩී-01